# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2024

**7 ශ්‍රේණිය**

## භූගෝල විද්‍යාව

නම/ විභාග අංකයඃ ........................................ කාලය ;- පැය 2 යි

- **අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා හිස්තැන මත ලියන්න.**

(1) අක්ෂාංශ $0^0$ මගින් දැක්වෙන්නේ ................................ යි.

i. කර්කටක නිවර්තනය  ii. සමකය
iii. ග්‍රිනිච් රේඛාව  iv. ජාත්‍යන්තර දින රේඛාව

(2) ලෝකයේ නගර අතරින් කුඩාම නගරය ................................ නගරය වේ.

i. පැසිපික්  ii. අත්ලාන්තික්
iii. ආක්ටික්  iv. ඉන්දියන්

(3) පෘථිවියේ ඇති මහද්වීප ................................ කි.

i. 7  ii. 5  iii. 3  iv. 8

(4) මුහුදු මට්ටමේ සිට $30m - 300m$ අතර කලාපය ................................ නම් වේ.

i. මධ්‍ය කඳුකරය  ii. වෙරළබඩ තැනිතලාව
iii. තෙත් කලාපය  iv. අභ්‍යන්තර තැනිතලාව

(5) ශ්‍රී ලංකාවට අයත් රාෂ්ට්‍රීය මුහුදු සීමාව ................................ කි.

i. පැ. සැ. 12 කි.  ii. පැ. සැ. 24 කි.
iii. පැ. සැ. 200 කි.  iv. පැ. සැ. 20 කි.

- අංක 06 - 10 දක්වා ප්‍රකාශ හරි නම් √ ලකුණ ද වැරදි නම් × ලකුණ ද යොදන්න.

(6) ශ්‍රී ලංකාවේ වියළි කලාපය හා තෙත් කලාපය වෙන් කරනු ලබන්නේ කැළණි ගඟ මඟිනි. (    )

(7) ජාතික උරුම අතරින් සිංහරාජ වනාන්තරය ස්පෘශක උරුමයකි. (    )

(8) කඩොලාන ශාක ශුෂ්ක කලාපය තුළ දක්නට ලැබේ. (    )

(9) පෘථිවි ආදර්ශ ගෝලයේ උතුරේ සිට දකුණට ඇති මනඃකල්පිත රේඛා දේශාංශ රේඛා ලෙස හඳුන්වයි. (    )

(10) ශ්‍රී ලංකාවේ සාක්ෂරතාව 92% කි. (    )

- ප්‍රශ්න අංක 11 - 15 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුර හිස්තැන මත ලියන්න.

(11) විශාල, අඛණ්ඩව විහිදෙන, බොහෝ විට ජලයෙන් වෙන් වූ භූ ස්කන්ධ ................................ ලෙස හැඳින්වේ.

(12) යාපනය අර්ධද්වීපය ආශ්‍රිතව ජීවත්වන ජනයාට ................................ ප්‍රයෝජනවත් ශාකයකි.

(13) අධික අවුරුද්දක් යෙදෙන්නේ වසර ................................ කට පසුවය.

(14) ශ්‍රී ලංකාවේ වර්ග ප්‍රමාණය වර්ග කිලෝමීටර් ................................ කි.

(15) ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශවලට ................................ මඟින් වැසි ලැබේ.

- අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර යා කරන්න.

| | | |
|---|---|---|
| (16) | දකුණු ආසියාවට අයත් රටවල් ගණන | ඕස්ට්‍රේලියාව |
| (17) | ලොව කුඩාම මහද්වීපය | 7 |
| (18) | පෘථිවි ගෝලයේ මතුපිට වර්ග ප්‍රමාණය | 12714 |
| (19) | පෘථිවියේ ධ්‍රැව ස්කන්ධය | පැසිපික් |
| (20) | ලෝකයේ විශාලතම සාගරය | 5.10 |

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න

(1) (අ) දී ඇති ලෝක ආකෘති සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.




i. A අක්ෂරයෙන් දක්වා ඇති දූපත නම් කරන්න. (ල. 1)

ii. B අක්ෂරයෙන් දක්වා ඇති මුහුද නම් කරන්න. (ල. 1)

iii. C හා D අක්ෂරයෙන් දක්වා ඇති රටවල් 2ක් නම් කරන්න. (ල. 2)

iv. E අක්ෂරයෙන් දක්වා ඇති දේශාංශක නම් කරන්න. (ල. 2)

v. F අක්ෂරයෙන් දක්වා ඇති සාගරයේ නම ලියන්න. (ල. 2

(ආ) දී ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියම ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. පේදුරුතුඩුව දැක්වෙන අක්ෂරය (ල. 1)

ii. F අක්ෂරයෙන් දැක්වෙන දිස්ත්‍රික්කය (ල. 1)

iii. C අක්ෂරයෙන් දැක්වෙන දූපත (ල. 2)

iv. D අක්ෂරයෙන් දැක්වෙන සුළං වර්ගය (ල. 2)

v. E අක්ෂරයෙන් දැක්වෙන දිස්ත්‍රික්කය (ල. 2)



(2)

i. පෘථිවි පරිභ්‍රමණයට ගත වන කාලය කොපමණද? (ල. 2)

ii. පෘථිවි ආදර්ශ ගෝලයේ ඇති දේශාංශ යනු මොනවාදැයි පැහැදිලි කරන්න. (ල. 3)

iii. පහත රූපයේ දැක්වෙන A, B, c, D, e, f අක්ෂර වලින් දක්වා ඇති අක්ෂාංශ නම් කරන්න. (ල. 5)




(3)

i. දූපතක් යනු කුමක්ද? (ල. 2)

ii. පෘථිවියේ ඇති දූපත් 3ක් නම් කරන්න. (ල. 3)

iii. ඔබ දන්නා මහද්වීප 5ක් නම් කරන්න. (ල. 5)

(4)

i. ශ්‍රී ලංකාවේ සාමාන්‍යයෙන් වියළි කාලගුණයක් ඇති මාස 2ක් නම් කරන්න. (ල. 2)

ii. ඔබ දන්නා අස්පෘශ උරුම 03ක් නම් කරන්න. (ල. 3)

iii. ශ්‍රී ලංකාවේ වෙරළබඩ තැනිතලාවේ දැකිය හැකි භෞතික ලක්ෂණ 05ක් ලියන්න. (ල. 5)

(5)

i. ශ්‍රී ලංකාව තුළ ජීවත් වන ප්‍රධාන ජන වර්ග 02ක් නම් කරන්න. (ල. 2)

ii. ශ්‍රී ලංකාවට වැසි ලැබෙන ප්‍රධාන ක්‍රම 03ක් ලියා දක්වන්න. (ල. 3)

iii. එයින් එක් වැසි ලැබෙන ක්‍රමයක් පිළිබඳව පැහැදිලි කරන්න. (ල. 5)

(6)

i. දකුණු ආසියානු කලාපයට අයත් දූපත් 02ක් නම් කරන්න. (ල. 2)

ii. දකුණු ආසියානු කලාපයට අයත් රටවල් 3ක් ලියන්න. (ල. 3)

iii. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන හෝ සෞඛ්‍ය මට්ටම අනෙකුත් දකුණු ආසියාතික රටවලට වඩා ඉහළින් පැවතීමට බලපා ඇති හේතු පැහැදිලි කරන්න. (ල. 5)

(7)

i. කඳුකර භූ දර්ශනයක දැකිය හැකි කැපී පෙනෙන භෞතික ලක්ෂණ 02ක් ලියන්න. (ල. 2)

ii. කඳුකරයේ සිදු කෙරෙන ප්‍රධාන කෘෂිකාර්මික කටයුතු 03ක් නම් කරන්න. (ල. 3)

iii. කඳුකරයේ සිදු කෙරෙන මානුෂ ක්‍රියාකාරකම් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 5)

(8)

i. වියළි කලාපීය භෞතික භූ දර්ශනයේ කැපී පෙනෙන ලක්ෂණ 02ක් ලියන්න. (ල. 2)

ii. වියළි කලාපීය භූ දර්ශකයේ දැකිය හැකි වනෝද්‍යාන 03ක් ලියන්න. (ල. 3)

iii. වියළි කලාපීය භූ දර්ශකයේ ප්‍රධාන ලක්ෂණ 03ක් පැහැදිලි කරන්න. (ල. 5)